# ජනමාධ්‍ය ඝාතනය -ඇමති සහ වේදය

ජනමාධ්‍ය ඇමැති අනුර ප්‍රිය දර්ශන මහතා 20දා පුවත්පත් සාකච්ඡාවක කතා කරමින් ජනමාධ්‍යවේදියාට අලුත් නිර්වචනයක් දුන්නේ ය. එනම් ආණ්ඩුවට අනුව ජනමාධ්‍යවේදියා යනු ප්‍රවෘත්ති දෙපාර්ථමේන්තුව විසින් නිකුත් කරන ජනමාධ්‍ය හැඳුනුම් පත ඇති අය පමණක් බව යි. මේ විග්‍රහය අප මේ අසන්නේ පළමු වතාවට ය. ඇත්තටම නම් කණගාටුවෙන් නමුත් කිව යුත්තේ මේ කතාව පෙන්වන්නේ ජනමාධ්‍ය ඇමැතිවරයාගේ සහ ඔහුගේ උපදේශකයින්ගේ නොදැනුවත්කම පමණක් බව යි.

ඒ අනුව විග්‍රහ කරමින් ඔහු කියා සිටියේ පසුගිය වසර තුළ මෙරට ඝාතනය වී ඇත්තේ එකම ජනමාධ්‍යවේදියකු පමණක් බව යි. නමුත් ඔහුගේ නම කීමට ඇමැතිවරයා අසමත් විය. උදයන් පුවත්පතෙහි සේවය කළ සෙල්වරාජ් රජීව්වර්මන් 2007 අප්‍රෙල් 29 දා යාපනයේ දී ඝාතනය කෙරුණි. ඔහු සතුව හෝ 2007 වර්ෂය සඳහා ප්‍රවෘත්ති දෙපාර්ථමේන්තුව නිකුත් කළ හැඳුනුම් පතක් තිබුනේයැයි සිතීමට නොහැකි ය. එසේ නොතිබුනේ නම් ඔහු ද ජනමාධ්‍යවේදියකු ලෙස මිය ගොස් නැත.

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයෙහි ජනමාධ්‍ය තේරුම් ගැනීම සහමුලින්ම වෙනස් ය. මුද්‍රිත, විද්‍යුත්, හෝ අන්තර් ජාල මාධ්‍ය හරහා වෘත්තියක් වශයෙන් තොරතුරු එකතු කිරීමෙහි, සංස්කරණය කිරීමෙහි සහ බෙදා හැරීමෙහි සංවිධිතව හෝ තනිව යෙදී සිටින ඕනෑම අයකු ජනමාධ්‍යවේදයට අයත් ය.  එපමණක් නොව අනෙක් අයට ද බලා කියවිය හැකි පරිදි අන්තර් ජාලයෙහි සිය සමාජ දේශපාලන දින සටහන් ලියන බ්ලොග්කරුවන්ද මෙම නිර්වචනයට අසු නොවන ජනමාධ්‍යවේදීන් වේ. මියන්මාරයේ සිට ද චීනයේ සිටද ඉරාකයේ සිට ද ලොවට බෙහෝ වැගත් තොරතුරු ලැබෙන්නේ මෙම බ්ලොග්කරුවන් හරහා ය.

ජනමාධ්‍යයේ ප්‍රධාන වගකීම  නිවැරදිබව, අපක්ෂාපතිත්වය සහ සාධාරණත්වය හැකිතාක් දුරට රැක ගැනීමය. ඊට හානි වන පරිදි කැරෙන ජනමාධ්‍යයට අදාළ කවරකු හෝ  ඝාතනයක කිරීම ජනමාධ්‍යවේදීන් ඝාතනය කිරීම යන පොදු ව්‍යවහාරය තුළට ඇතුල් කෙරෙන්නේ එනිසා ය. අද ජගත් ව්‍යවහාරය එය යි.

ජනමාධ්‍ය ඇමැතිවරයා ඉල්ලා සිටින හැඳුනුම්පත ජනමාධ්‍ය මර්දනය සඳහා මිනුමක් නොවන්නේ එනිසා ය.

අ007 පෙරවාරි 15 දින යාපනයේ  යුද හමුදා සොදිසි මුර පොළක නවත්වා ගැනීමෙන් පසු ජනමාධ්‍යවේදී සුබ්‍රමනියම් රාමචන්ද්‍රන් අතුරුදහන් විය. මේතාක් ඔහු පිළිබඳ කිසිදු තොරතුරක් නැත. ඔහු යාල් තිනක්කුරල් සහ වාලම්පුරි පුවත්පත්හි වඩමරච්චි වාර්තාකරු ලෙස කටයුතු කළේ ය. ඇමැතිවරයා ඉල්ලා සිටින හැඳුනුම්පත තිබුනේ නැත.

2007 අප්‍රේල් 16දා ඝාතනය කරන ලද සුභාස් චන්ද්‍රබෝෂ් නිලාම් නමින් කුඩා සඟරාවක් ලියා පළ කල අතර වව්නියාවෙහි විකල්ප දෙමළ මාධ්‍ය බෙදා හැරීමෙහි නියුතු විය. ලංඩනයේ පළ වන ටැමිල් වර්ල්ඩ් සඟරාවට ලිපි සැපයී ය. කුඩා මුද්‍රණාලයක්ද පවත්වා ගෙන ගියේය. ඔහුට දීර්ඝ කාලයක නිදහස් ජනමාධ්‍යවේදී ඉතිහාසයක් ද තිබුණි. ඇමැතිවරයා ඉල්ලා සිටින හැඳුනුම්පත තිබුනේ නැත.

අගෝස්තු 01 ඝාතනය කරන ලද සහදේවන් නිලක්ෂන් ජනමාධ්‍ය ශිෂ්‍යයකු මෙන්ම වාර්තාකරුවකු ද විය. චාලරම් නම් සඟරාවක් ද පවත්වා ගෙන ගියේ ය. ඇමැතිවරයා ඉල්ලා සිටින හැඳුනුම්පත තිබුනේ නැත.

ආණ්ඩුව පිළි එකඟ නොවූවද ජිනීවා ගිවිසුම් අනුව යුද වැදී සිටින පාර්ශවයන් හි ජනමාධ්‍යවේදීන් සැළකෙන්නේ සිවිල් පුරවැසියන් ලෙස ය. එනයින් කොටි හඬ ගුවන් විදුලියට බෝම්බ දමා රජය විසින් මරා දමන ලද එහි ඉසයිවිසී චැම්පියන් හෙවත් සුබාජිනී නම්

මාධ්‍යවේදියා ඇතුලු සේවකයින් තිදෙනාම අන්තර් ජාතික ලැයිස්තුවලට ඇතුලු වීම වැළැක්විය නොහැකි ය.

ඇමැතිවරයා ගණන වරද්දා ගෙන නවයක් ලෙස දැක්වුව ද පසුගිය වසර තුළ ඝාතනය වූ ජනමාධ්‍යාවේදීන් සත් දෙනා ලෙස ප්‍රෙස් එම්බ්ලෙම් ව්‍යාපාරය ඔවුන් ය.

පසුගිය නොවැම්බර් මාසයෙහි යාපනයේ තවත් මාධ්‍ය සේවකයින් දෙදෙනෙකු ( ඇන්නතිපිල්ලෙයි සිත්රාජන් සහ වඩිවේල් නිමලරාජ්) පැහැර ගැනුනි. ඔවුන් පිළිබඳ කිසිදු තොරතුරක් තවම නැත.  එමෙන්ම දිවයින පුවත් පතෙහි ජනමාධ්‍යවේදියකු ( ඩබ්. ගුනසිංහ) ද කැබිතිගොල්ලෑව ක්ලේමෝ ප්‍රහාරයේ දි මරණයට පත් විය.

කරුණු මෙසේ වුවත් වඩාම කණගාටුවට කාරණය මෙම හැදුනුම්පත බලා ජනමාධ්‍යවේදය තීරණය කරන අනුර ප්‍රියදර්ශන පිළිවෙත නොවේ. ජනමාධ්‍ය ඇමැතිවරයා වශයෙන් ඔහු දැක් වූ අමානුෂික ස්වභාවය යි. හැදුනුම්පත් නැත්නම් ඒ මරණ මට ප්‍රශ්නයක් නොවේ යන කටුක ඇගවීම යි.

අනෙක් අතට ජනමාධ්‍ය ඇමැතිවරයා පිළිතුරු දිය යුත්තේ පසුගිය වසර තුළ මෙරට ජනමාධ්‍ය මුහුණ දුන් සියළු ගර්ජන මර්දන තර්ජන සම්බන්ධයෙනි.

මව්බිම සහ ලීඩර් පුවත්පත් සමූහයට එරෙහිව මුදා හරින ලද අනේනානාර භීෂනයන්, ඒබීසී ගුවන් විදුලි ජාලය වසා දැමීම, කතුවරුන්ට එරෙහි තර්ජන ගර්ජන, අත්තාස් විරෝධි ආණ්ඩුවේ ව්‍යාපාරය, ප්‍රදේශිය ජනමාධ්‍යවේදින්ට එල්ලවන නිරන්තර තර්ජන ගර්ජන, රාජ්‍ය ජනමාධ්‍ය අගතිගගාමිත්වය,  සහ ජනමාධ්‍ය නිදහස සඳහා අවශ්‍ය නීතිමය රාමුව ගැන ජනමාධ්‍ය ඇමැතිවරයාගේ නිහඩතාවය පුදුමාකාර ය.

වසර අවසාන වන්නට යන්නේ එම කිසිදු ක්‍රියාවක් අරභයා කිසිදු නීතිමය පියවරක් ගැනීමට ඔහුගේ ආණ්ඩුව අසමත් වූ තත්ත්වයක් යටතේය. ලැජ්ජාවට කාරණය එයයි.

අන්තර් ජාතික ප්‍රජාවට බැණ වැදීමෙන් නීතියේ පාලනය පිහිටුවීමට සිය අසමත් බව සහ අකැමැත්ත වසා ගැනීමට මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට නොහැකි බව අවසන් වශයෙන් කියා සිටිමු.